# කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : **01** WW/T/18/05/03/01
වර්ණය : ඇම්බර්

## අකුණු සහ තද වැසි පිළිබඳව අනතුරු ඇඟවීම

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්**
2018 මැයි මස 03 වන දින ප.ව. 11.00 වන තෙක් වලංගු වන පරිදි
2018 මැයි මස 03 වන දින ප.ව. 04.00 ට නිකුත් කරන ලදී.

**<u>බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ සහ දකුණු පළාත් වල මහජනතාව සඳහා</u>**

### විමසිලිමත් වන්න !

ඉහත අනතුරු ඇඟවීම් ප්‍රදේශවල ඉදිරි පැය කිහිපය තුල (පැය හතක පමණ කාලයක් සඳහා) ගිගිරුම් සහිත වැසි සමග ප්‍රහල අකුණු සහ ගිගිරුම් ඇතිවීමේ හැකියාව පවතී. සමහර ස්ථානවලට මි.මී. **75** ට වැඩි තරමක් තද වැසි බලාපොරොත්තු වේ.

ගිගිරුම් සහිත වැසි සමග පැ.කි.මී. **70-80** ක පමණ කෙටිකාලීන තද සුළං ද ඇති විය හැක




### ආරක්ෂිත පියවර:

අකුණු සහ ගිගුරුම් පවතින අවස්ථාවල පහත ආරක්ෂිත පියවරයන් අනුගමනය කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවට අවවාද කෙරේ.

- එළිමහනේ හෝ ගස් යට නොසිටිය යුතු අතර ආරක්ෂිත ගොඩනැගිල්ලක් හෝ සංවෘත වාහනයක් තුළ රැඳී සිටින්න.
- කුඹුරු, තේ වතු, ක්‍රීඩා පිටි මෙන්ම ජලාශ වැනි විවෘත ස්ථාන වල රැඳී සිටීමෙන් වලකින්න.
- රැහැන් සහිත දුරකථන සහ විදුලියට සම්බන්ධ කරන ලද විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
- බයිසිකල්, ට්‍රැක්ටර් සහ බෝට්ටු වැනි විවෘත වාහන භාවිතයෙන් වලකින්න.
- තද සුළං හේතුවෙන් ගස් හා විදුලි රැහැන් බිම ඇද වැටීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

Spatial rainfall distribution: Isolated: <25%, A few: 26-50%, Many: 51-75%, Most: 76-100%
Rainfall amount (mm): Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.